තහංචි මැද්දෙන්

# මහින්ද චින්තනය- 1990

ජිනිවා හි මානව හිමිකම් කොමිසමෙහි ශ්‍රී ලංකාණ්ඩුවට එරෙහිව කුමන්ත්‍රණයක් සිදුවෙමින් ඇතැයි පැපරල් සංවිධානයේ නායක කිංස්ලි රොද්රිගු මහතා  කළ ප්‍රකාශය ඉන් පසු තවත් ගණනාවක්  විසින් ම පුනරුච්චාරණය කෙරුණි.

එම මහත්වරු සියළු දෙනාම කියා සිටියේ ජිනීවාහි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම හමුවෙහි ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කෙළෙසීම පිලිබඳව චෝදනා කිරීම රට පාවා දීමක් හා සමාන බව යි.  ඒ බව මාර්තු 12වන දින ආණ්ඩුවේ ඩේලි නිව්ස් පුවත් පත මෙසේ වාර්තා කළේ මෙසේ ය: *පැපරල් සංවිධානයේ නායක කිංස්ලි රොද්රිගු කියන්නේ ආණ්ඩුවේ ප්‍රතිරූපය අව වර්ණ කිරීම පිනිස ජිනීවා හි මානව හිමිකම් කොමිසම හමුවේ මානව හිමිකම් කෙළෙසීම ගැන චෝදනා කොට දේශපාලන සහ වෙනත් කණ්ඩායම් විසින් කුමංත්‍රණයක් ගෙන යන බව යි.*

## <u>දේශද්‍රෝහියෝ</u>

ජිනීවාහි මුළුදෙන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම හමුයේ මෙරට මානව හිමිකම් රැක ගැනීමට අදහස් ඉදිරිපත් කරන පිරිස් දේශද්‍රෝහීන් යැයි  ආණ්ඩුවේ දේශපාලනයට නතු එනමුත් ස්වාධින ජනමාධ්‍ය ලෙස පැවැතිය යුතු රාජ්‍ය ජනමාධ්‍ය යළි යළි චෝදනා කරනු පසුගිය සති කිහිපය තුළම දක්නට ලැබුණි.

රටක් මානව  හිමිකම් තත්ත්වය පිළිබඳව අන්තර් ජාතික මානව හිමකම් රැක ගැනීමේ යාන්ත්‍රනයන්ට පැමිණිලි කිරීම රටක පුරවැසියන් ගේ අනුලංඝනීය අයිතිවාසිකමකි. නමුත් පාලකයින් එම අයිතිය පිළි ගන්නේ නැත.

1990 ශ්‍රී ලංකාව දරුණු සිවිල් යුද්ධ දෙකකට මුහුණ දී සිටි අවධියකි. ජවිපෙ කැරුල්ල පරාජය වී තිබූ නමත් එල්ටීටීඊ සන්නද්ධ අරගලය අවසන්ව තිබුනේ නැත. අද ජනාධිපති එදි විපක්ෂයේ මංත්‍රීවරයකු විය. අද ඔහුගේ ආණ්ඩුවේ ක්ෂමාලාපකයින් එදා සිටියේ නම් නොවරදාවාම ඔහු ද ජාති ද්‍රෝහියකු ලෙස හංවඩු ගසන්නට ඉඩ තිබුණි. ඒ මෙන්න මේ නිසා ය:

## <u>එදා මහින්ද</u>

**1990 දිවයින පුවත්පත, දිනය මාර්තු 29 පිටුව 07.**

*ණය දෙන ජාත්‍යාන්තර සංවිධාන වලින් ණය ලබා ගන්නා රටවල මානව අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් අනුගමනය කරන ප්‍රතිපත්තිය සළකා බැළිය යුතු යැයි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ප්‍රඥාප්තියට ඇතුල් කළ යුතු බවට ජාත්‍යන්තර මතයක් ගොඩ නැගීම සඳහා උත්සාහ කරන බව මානව හිමිකම් සහ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පාර්ලිමේන්තුවාදීන්ගේ කමිටුවේ ලේකම් මහින්ද රාජපක්ෂ සහ සහ එහි උප ලේකම් වාසුදේව නානායක්කාර යන මහත්වරු .. 27වනදා පැවැති පුවත්පත් සාකච්ජාවක දී පැවසූහ.*

*පසුගිය දා ජිනීවා හි පැවැති එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමාසමට සහභාගි වූ නියෝජිතයින් දෙදෙනා එහිදී තමන්ගේ ක්‍රියාකාරිත්වය පිලිබඳව කරුණු පැහැදිලි කිරීම සඳහා මෙම පුවත්පත් සාකච්ජාව කැදවා තිබුණි.*

*..එම සමුළුවට සහභාගිවීමට පැමිණි විවිධ රටවල නියෝජිතයින් හා රජයේ නොවන ජාත්‍යන්තර සංවිධානවල නියෝජිතයින් සමඟ සාකච්ජා කොට ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ අවස්ථාවන් ගැන ඔවුන්ට අවබෝධයක් පබා දීමං තමන්ට හැකි වූ බව ද ඔව්හු කියා සිටිය හ.*

*ජනතා විමුක්ති පෙරමුණ මර්ධනය කිරීමේ මුවාවෙන් කරන ලද ඝාතන හිංසා කිරීම් සහ අතුරුදහන් කිරීම් සහ ජනතා විමුක්ති පෙරමුනේ ක්‍රියාකාරිත්කය පිලිබඳව ද කරුණු පැහැදිලි කළ බව කියා සිටි මහින්ද රාජපක්ෂ සහ නානායක්කාර යන මහත්වරු වෘත්තීය සමිති මර්ධනය, වෘත්තීය සමිති නිලධාරීන් පැහැර ගැනීම, හා ඝාතනය කිරීම් පිළිබඳව ද තොරතුරු අනාවරණය කල බව කියා සිටිය හ.*

*..කැනඩාව, නෙදර්ලන්තය, එංලගන්තය, ස්වීඩනය ඇතුළු රටවල් කිහිපයකම නියෝජිතයෝ තමන් විසින් හෙළි කරන ලද ශ්‍රී ලංකාවේ තත්ත්වය පිලිබඳව විශේෂ අවධානයක් යොමු කරන බව පැවසූයේ යැයි ද ඔව්හු කී ය.*

*ශ්‍රී ලංකාවට ලැබෙන ණය ආධාර නතර කිරීමට තමන්ට කිසිම අවශ්‍යතාවයක් නැතැයි ද ලංකාව පමණක් නොව ලෝකයේ ඕනෑම රටක් මානව හිමිකම් උල්ලංඝනය කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් බලපෑමක් කිරීමට ලෝකයේ බොහෝ රටවල් කැමැත්තක් දක්වන බව තමන් කළ සාකච්ජාවලදී හෙළි වූයේ යැයි ද ඔව්හු පැවැසූහ.*

## <u>එන්ජීඕ මහින්ද</u>

***එවැනි බලපෑමක් ඇති කල හැකි වගන්ති එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ආරක්ෂා කිරීමේ කොමිසමට ඇතුළත් කිරීම සඳහා ජාත්‍යන්තර මතයක් ගොඩ නැගීමට කටයුතු කිරීම පිනිස ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන දොළහක සහභාගිත්වයෙන් නිල නොවන කමිටුවක් පිහිටුවා ගැනීමට හැකි වූ බවත් ඔව්හු කි ය.***

එළෙස මහින්ද රාජපක්ෂ මහතා මානව හිමිකම් කොමිසමට පැමැණිළි කළා පමනක් නොවේ, මානව හිමිකම් කෙළෙසන ශ්‍රී ලංකාව වැනි රටවලට දෙන ආධාර නතර කල යුතු බවට වගන්ති එක්සත් ජාතීන්ගේ ආයතනයන්ට එකතු කළ යුතු බවට තමා යෝජනා කරන බව ද ප්‍රසිද්ධියේ කියා සිටියා ය. එපමණක් ද නොවේ නමා මෙම පියවර ගනිමින් සිටින්නේ අන්තර් ජාතික රාජ්‍ය නොවන සංවිධාන 12ක් සමඟ එක්ව යැයි ද කියා සිටියා ය.

එකළ මහින්ද රාජපක්ෂ ලක්දිව පුවත්පතට දුන් සම්මුඛ සාකච්ජාවක කියා සිටියේ අපේ ආණ්ඩුවක් යටතේ කිසිම පුද්ගලයකු අතුරුදහන් නොවනු ඇති බවයි. එම සම්මුඛ සාකච්ජාව ලක්දිව පුවත්පතට වෙනුවෙන් කලේ කව්රුන්දැයි ඔබට හැකි නම් සිතා ගන්න,

ඒ අන් කිසිවකු නොව අද මහින්ද රාජපක්ෂ මහතාගේ උපදේශකයකු සහ සමීපතමයකු වන ඩලස් අලහප්පෙරුම ය.

ඉතිහාසය පෙරළා බැලීම මෙම කාටකාටත් යහපත් වන්නේ අඩුම ගනනේ ස්වකීය හෘද සාක්ෂිය විමසා අද තමන්ගේ දේශපාලනය ගැන යළි සිතා බැලීම පිණිස ය.

## <u>එදා රනිල්</u>

මේ සටහන මහින්ද රාජපක්ෂ සහ ඩලස් අලහප්පෙරුම ගැන පමණක් කියා අවසන් කළහොත් එය නියම අවසානයක් නොවේ. 1990 දී ම මහින්ද රාජපක්ෂ මහතා මානව හිමිකම් සම්බන්ධයෙන් එතෙර යවන ලද ලියැවිලි ගනනාවක් ගුවන් තොටුපොලෙහි දී අත්අඩංගුවට ගැනුණි.

අද මානවහිමිකම් පිළිබඳ කතා කරන අප රටට වින කරන බවට චෝදනා කරන්නේ එදා මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටි මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුව යි. එදා මහින්ද රාජපක්ස මහතාට එල්ල වූයේ එම චෝදනාවම යි. එම චෝදනාව කලේ කව්දැයි කියා හැකි නම් සිතා ගන්න.

වෙන කව්රුවත් නොවේ අද විපක්ෂ නායක වශයෙන් මානව හිමිකම් උද්ඝෝෂනයේ යෙදෙන රනිල් වික්‍රමසිංහ ය. ඔහු කීවේ මෙසේ යඃ

## දිවයින 1990 මැයි 19 දාඃ

*ගුවන් තොටුපළේ දී අත් අඩංගුවට ගත් රජය වෙනුවෙන් පිළිතුරුදුන් සභානායක රනිල් වික්‍රමසිංහ මහතා මෙම සිද්ධිය ගැන පරීක්ෂා කරන බවත් එහෙත් පාර්ලිමේන්තු සංවිධානයක නම පාවිච්චි කරමින් රාජපක්ෂ මහතා මෙම ලිපි යවා ඇත්තේ ශ්‍රී ලංකාවට විරුද්ධව ජාත්‍යන්තර ප්‍රචාරයක් ගෙන යන ටැමිල් ටයිම්ස් කර්තෘ රාජනායගම් නැමැත්තාට හා ජනතා විමුක්ති පෙරමුණේ සෝමවංශ අමරසිංහ මහතාගේ මිත්‍රයකු වන ... නැමැත්තාට බවත් කී ය.*

*ශ්‍රී ලංකාවට ආධාර නොදෙන ලෙසට ආධාර දෙන රටවලට බැලපෑම් කිරීමේ ව්‍යාපාරයකට සහයෝගය දීමක් මහින්ද රාජපක්ෂ මහතාගේ ලිපිවලින් සිදු කර ඇති බව පෙනී යනවා*

සිදුවීම් සිදුවන්නෙ සිනහ වීමට හෝ ඇඬීමට නොවේ නම් මේ හාස්‍ය ජනක නාටකයන් දෙස බලා අප කළ යුත්තේ කුමක් ද?

එදා ජනතා විමුක්ති පෙරමුණ තහනම් පක්ෂයක් විය. නමුත් එහි ප්‍රසිද්ධ ප්‍රකාශකයින් සිටියහ. අද ජාත්‍යාන්තර ක්ෂමා සංවිධානය සහ අන්තර් ජාතික රතු කුරුස සංවිධානයට බැට දෙන ජවිපෙ එදා පිහිට පැතුවේ එම ආයතනයක් ගෙන් බව පමණක් සදහන් කිරීම ද මෙම සටහන සම්පූර්ණ කිරමට අවශය ය.

සුනන්ද දේශප්‍රිය